පාර්ලිමේන්තු ප්‍රකාශ මාලා අංක - 488

ආයතනයේ නම : විදේශ කටයුතු විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක (119)(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இல. 488

வெளிநாட்டு அலுவல்கள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் சுற்றுலாத்துறை அமைச்சு

பாராளுமன்றத்தின் அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவினால் சமர்ப்பிக்கப்பட்ட அறிக்கைகள் தொடர்பில் நிலையியற் கட்டளை இல. (119)(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புகள் மற்றும் எடுக்கப்படும் நடவடிக்கைகள்

பாராளுமன்றத்திற்குச் சமர்ப்பித்தல்

Parliamentary Series No. 488

Name of the Institution: Ministry of Foreign Affairs, Foreign Employment and Tourism

Presentation to Parliament of the observations and actions taken by the Honorable Minister under Standing Order No. (119)(4) regarding the reports tabled by the Committee on Public Accounts in Parliament.

පාර්ලිමේන්තු ප්‍රකාශ මාලා අංක : 488

ආයතනයේ නම : විදේශ කටයුතු විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය

අනු අංක	කාරක සභාව විසින් ලබා දෙන ලද නිර්දේශ	නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන විසින් ගෙන ඇති පියවර / වත්මන් තත්ත්වය
01	ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රතිපත්තිය 2024 පෙබරවාරි මස 26 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමත වී තිබුණ ද මෙතෙක් එය ගැසට් පත්‍රයේ පළ කිරීමට කටයුතු නොකිරීම හා ඒ හේතුවෙන් සංචාරක උපාය මාර්ගික සැලසුම් සකස් නොකිරීම සම්බන්ධයෙන් කාරක සභාව විසින් විමසා සිටින ලදි. අමාත්‍ය මණ්ඩලයට යොමු කරන ලද සංචාරක ප්‍රතිපත්තියේ දෙමළ පරිවර්තනයේ සෝදුපත් බැලීම මේ වන විට සිදු කරනු ලබන බවත්, එය අවසන් වූ පසු සංචාරක ප්‍රතිපත්තිය ගැසට් පත්‍රයේ පළ කිරීම තවත් සතියක පමණ කාලයක් තුළ සිදු කළ හැකි බවටත් සංචාරක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරි (ප්‍ර.ග.නි)/ ගණන්දීමේ නිලධාරි (ග.නි.) විශ්වාසය පළ කළේය. එමෙන්ම සංචාරක උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීමේ කටයුතු ද ආරම්භ කර ඇති බව ප්‍රකාශ කළ ප්‍ර.ග.නි./ ග.නි. එම සැලැස්ම සකස් කිරීමේදී ආසියානු සංවර්ධන බැංකුව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට අවශ්‍ය බව ද සඳහන් කළේය. එම සැලැස්මට අදාළ කටයුතු ද මෙම මාසය අවසන් වන විට සකස් කර අවසන් කළ හැකි වනු ඇති බව ද ප්‍ර.ග.නි. ග.නි. සඳහන් කර සිටියේය.	ශ්‍රී ලංකාවේ සංචාරක ප්‍රතිපත්තිය 2024 පෙබරවාරි මස 26 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී අනුමත කරන ලදී. ඒ අනුව එය ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා අවශ්‍ය භාෂා පරිවර්තන හා සෝදුපත් බැලීම සිදු කරන ලදී. එහෙත් 2024 නව රජය පත්වීමත් සමඟ නව රජය මගින් නව සංචාරක ප්‍රතිපත්තියක් එළි දක්වන ලදී. නව සංචාරක ප්‍රතිපත්තිය ද අධ්‍යයනය කර ඒ අනුව අනුමත සංචාරක ප්‍රතිපත්තියේ සංශෝධන සිදු වීමට අවශ්‍ය නම් ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු සිදු කළ යුතු බැවින් සංචාරක ප්‍රතිපත්තිය ගැසට් පත්‍රයේ පළ කිරීම ප්‍රමාද කරන ලදී. එමෙන්ම සංචාරක උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම සඳහා ලෝක බැංකු අධාර ව්‍යාපෘතිය යටතේ විශේෂඥ සහාය ලබා ගැනීම සඳහා මේ වන විට ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇති අතර ඒ අනුව සංචාරක උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම 2026 වර්ෂයේ දී ආරම්භ කිරීමට නියමිතය.
02	2005 අංක 38 දරන සංචාරක කටයුතු පිළිබඳ පනතේ 26 (3) වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන ප්‍රදේශ සම්බන්ධයෙන් නියෝග සකස් කිරීම සඳහා පැරණි පනත යටතේ ගැසට් කර ඇති සංචාරක ප්‍රදේශ නැවත ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට හා නියෝග සකස් කිරීමේදී ප්‍රමුඛතාවය ලබා දිය යුතු සංචාරක කලාප හඳුනා ගැනීමට කටයුතු කර, ඒ සම්බන්ධයෙන් වාර්තාවක් මාස 3 ක් තුළ (2024.08.06 දිනට පෙර) කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස සංචාරක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත කාරක සභාව නිර්දේශ කළේය. සංචාරක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/IAI/1/4/COPA හා 05.06.2024 දිනැති ලිපිය මගින් මූලික වාර්තාවක් ඉදිරිපත් කර ඇත.	2005 වර්ෂයේ සිට මේ දක්වා අදාළ රෙගුලාසි සකස් කර නොමැති අතර, කෙසේ වෙතත්, මේ වන විට ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) මූල්‍ය හා උපදේශන දායකත්වය යටතේ හඳුනාගත් පහත සඳහන් සංචාරක කලාප ගැසට් කිරීම සඳහා අවශ්‍ය නීති, රීති හා රෙගුලාසි සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. 01. **ආරුගම්බේ සංචාරක කලාපය** - අරුගම්බේ සංචාරක කලාපය සඳහා මූලික කෙටුම්පත සකස් කර අධ්‍යයනය සඳහා ඉදිරිපත් කර ඇත. 02. දඹුල්ල හා සීගිරිය සංචාරක කලාපය. 03. නුවරඑළිය සංචාරක කලාපය. 04. ගාල්ල සංචාරක කලාපය. 05. ඇල්ල සංචාරක කලාපය. මෙහි අංක **02/03/04/05** සඳහා පාර්ශවකරුවන්ගේ රැස්වීම් සහ ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු අවසන් කර ඇති අතර, ඉදිරියේදී මූලික කෙටුම්පත ඉදිරිපත් කිරීමට නියමිතය. සංචාරක ආකර්ෂණීය ස්ථාන හඳුනාගැනීමේ කටයුතු සිදු කරමින් පවතින අතර, දැනට හඳුනාගෙන ඇති ගමනාන්තවල සංවර්ධන කටයුතු ද ක්‍රියාත්මක කරමින් පවතී.
03.	සංචාරක සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය එක්ව සංචාරක කලාප හත (07) සඳහා සංවර්ධන	තවද, ඉදිරියට ඉනිරිව ඇති කලාප සඳහා සංචාරක සංවර්ධන සැලසුම් සකස් කිරීමට අදාළ වාර්තා සකස්

	සැලසුම් සකස් කිරීමේ අරමුණින් අවබෝධතා ගිවිසුමක් (MOU) අත්සන් කර ඇත. එම සැලසුම් අතරින් ඇල්ල, ආරුගම්බේ සහ නුවරඑළිය යන කලාප තුන සඳහා අවසන් වාර්තා (Final Reports) ඉදිරිපත් කර අවසන් කර ඇත. ඇල්ල කලාපය සඳහා සකස් කරන ලද සැලැස්ම මේ වන විට ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර අවසන් කර ඇත. ආරුගම්බේ කලාපය සඳහා අදාළ සැලැස්ම සම්බන්ධ අවසන් වාර්තා ද ඉදිරිපත් කර අවසන් කර ඇති අතර, එය ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කිරීම සඳහා නියමිතව ඇත. නුවරඑළිය කලාපය සඳහා ද අවසන් වාර්තා මේ වන විට ඉදිරිපත් කර ඇති අතර, ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යොමු කර ඇත. හික්කඩුව සහ කල්පිටිය කලාප සඳහා සකස් කරනු ලබන සංවර්ධන සැලසුම්වලට අදාළ අවසන් කෙටුම්පත් වාර්තා (Final Draft Reports) මේ වන විට ඉදිරිපත් කර ඇත. ඒ අතරින්, හික්කඩුව කලාපය සඳහා සකස් කරන ලද සැලැස්ම මේ වන විට ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර අවසන් කර ඇත. කල්පිටිය කලාපය සඳහා වන අවසන් කෙටුම්පත් වාර්තාව (Final Draft Report) ද ඉදිරිපත් කර අවසන් කර ඇති අතර, එහි අවසන් වාර්තාව (Final Report) සහ ගැසට් පත්‍ර ප්‍රකාශනය නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එක්ව නිම කිරීමට නියමිතව ඇත.	කිරීම සහ අනෙකුත් අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිතව ඇත. මෙහිදී, නාගරික සංවර්ධන අධිකාරිය සමඟ එක්ව එම කලාප 2 අතරින් කුමන කලාපයට ප්‍රමුඛතාව ලබා දෙමින් ඉදිරි කටයුතු ක්‍රියාත්මක කළ යුතුද යන්න පිළිබඳ සාකච්ඡා මේ වන විට සිදු වෙමින් පවතී.
04.	2024 අයවැය මගින් සංචාරක අමාත්‍යාංශයට වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් අමාත්‍යාංශය විසින් ක්‍රියාවට නැංවීමට සැලසුම් කර ඇති වැඩපිළිවෙළ සම්බන්ධයෙන් වාර්තාවක් සති 2 ක් තුළ (2024.05.22 දිනට පෙර) කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස සංචාරක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත කාරක සභාව නිර්දේශ කළේය. සංචාරක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MTIAI/1/4/COPA හා 28.05.2024 දිනැති ලිපිය මගින් අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇත.	2024.12.31 දිනට කිතුල්ගල හා පින්නවල සංචාරක තීරය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මි. 129 ක් සත්‍ය වියදම් ලෙස වාර්තා වී ඇති අතර 2025 වර්ෂයේ අතැති බිල්පත් ලෙස රු.මි 65ක් වෙන් කර තිබුණි. 2025 අයවැය මඟින් මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 300ක් වෙන් කර තිබූ අතර 2025.12.31 දිනට රු.මි.148ක් සත්‍ය වියදම් ලෙස වාර්තා වී තිබුණි. තවද මෙම ව්‍යාපෘතිය 2026 වර්ෂය සඳහා අවිච්ඡේද නොවූ බැවින් 2025 වර්ෂයේ අවිච්ඡේද බිල්පතක් (රු 829,762.83) ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි 2026 වර්ෂයේ සංවර්ධන සහයක වැඩසටහන සඳහා වෙන්කර ඇති වැය විෂය මඟින් ගෙවීම් සිදු කරන ලදී. 2024 වර්ෂය සඳහා ඉදිරිපත් කළ අයවැය මගින් සංචාරක අමාත්‍යාංශයට වෙන් කරන ලද රු.මි. 610ක ප්‍රතිපාදන මත සිදු කරන ලද ව්‍යාපෘති සම්බන්ධ වර්තමාන ප්‍රගතිය පහතින් සඳහන් කර ඇත. • මුළු ව්‍යාපෘති ගණන - 54 • 2024 වර්ෂයේ දී නිම කරන ලද ව්‍යාපෘති ගණන - 32 • අතැති බිල්පත් ගෙවා ඇති ව්‍යාපෘති ගණන - 04 (ව්‍යාපෘතිය නිම කර ඇත) • අවිච්ඡේද ව්‍යාපෘති ගණන - 02

		(මෙම ව්‍යාපෘති 02ක 2025 වර්ෂයේ දී වැඩ අවසන් කරන ලදී) • ප්‍රතිපාදන නැවත පවරා ගනු ලැබූ ව්‍යාපෘති ගණන - 12 • අමාත්‍යාංශ ප්‍රසම්පාදන ව්‍යාපෘති (ක්‍රියාත්මක නොවීය) - 01 • වයඹ සංවර්ධන සැලැස්ම(ප්‍රතිපාදන ලබා දී නොමැත) - 01 • පළාත් සභාවට වෙන්කර ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘති - 02 සත්‍ය වියදම :- 123,892,264.00 අතැති බිල්පත් සඳහා :- 17,702,334.09 (2025 වර්ෂයේ ගෙවීම් කරන ලදී)
05	නැවත නැවත ශ්‍රී ලංකාවේ සංචාරය කරනු ලබන සංචාරකයින් (Repeat Visitors) ප්‍රමාණය පිළිබඳව නිවැරදි දත්ත ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස සංචාරක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත කාරක සභාව නිර්දේශ කළේය. සංචාරක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MTIAI/1/4/COPA to 05.06.2024 දිනැති ලිපිය මගින් වාර්තාවක් ඉදිරිපත් කර ඇත. සංඛ්‍යා ලේඛනවලට අනුව ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින්ගෙන් සැලකිය යුතු ප්‍රතිශතයක් යළි මෙරටට පැමිණෙන බව පෙනී යන බව සඳහන් කර ඇත. සමීක්ෂණ වලට අනුව එම ප්‍රමාණය 2015 වර්ෂයේ 15% ක්ද, 2018 වර්ෂයේ 17.2% ක් ද වශයෙන් සඳහන් වේ.	**ශ්‍රී ලංකාවට නැවත පැමිණෙන සංචාරකයින් පිළිබඳ සමීක්ෂණය** *(2018/19 හා 2024/25 පිටත්ව යන සංචාරක සමීක්ෂණ අනුව)* 2018/19 සහ 2024/25 කාලසීමාවන් සඳහා සිදු කරන ලද පිටත්ව යන සංචාරක සමීක්ෂණවල දත්ත අනුව, 2018/19 සමීක්ෂණයේදී ප්‍රතිචාර දැක්වූ සංචාරකයින් 4,996 දෙනා අතරින් 857 දෙනෙකු (17.2%) මීට පෙර ශ්‍රී ලංකාවට පැමිණ තිබූ අතර, 4,139 දෙනෙකු (82.8%) ප්‍රථම වරට ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් විය. එසේම, 2024/25 සමීක්ෂණයේදී ප්‍රතිචාර දැක්වූ සංචාරකයින් 11,731 දෙනා අතරින් 2,026 දෙනෙකු (17.3%) නැවත පැමිණි සංචාරකයින් වන අතර, 9,705 දෙනෙකු (82.7%) ප්‍රථම වරට ශ්‍රී ලංකාවට පැමිණි සංචාරකයින් වේ. මෙම දත්ත දෙක සංසන්දනය කිරීමේදී, නැවත පැමිණෙන සංචාරකයින්ගේ ප්‍රතිශතය 2018/19 වර්ෂයේ 17.2% සිට 2024/25 වර්ෂයේ 17.3% දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් ඇති බව පෙනී යයි. කෙසේ වෙතත්, සමස්ත සංචාරකයින් අතර බහුතරය තවමත් ප්‍රථම වරට ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් බව නිරීක්ෂණය වේ. මෙය ශ්‍රී ලංකාව නව සංචාරකයින් ආකර්ෂණය කර ගැනීමේදී සාර්ථකත්වයක් පෙන්නුම් කළද, එම සංචාරකයින් නැවත පැමිණෙන සංචාරකයින් බවට පරිවර්තනය කිරීමේදී තවදුරටත් වැඩි අවධානයක් යොමු කළ යුතු ක්ෂේත්‍රයක් පවතින බවට සංඥා කරයි. 2018/19 කාලසීමාවට අදාළ මෙම සමීක්ෂණ වාර්තාව <u>ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA)</u> හි නිල වෙබ් අඩවිය මගින් ප්‍රකාශයට පත් කර ඇත. තවද, 2024/25 කාලසීමාවට අදාළ සමීක්ෂණ වාර්තාව ද නුදුරු අනාගතයේදී <u>SLTDA නිල වෙබ් අඩවිය</u> ඔස්සේ ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කෙරේ.

06.	ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය සතු දූපත් වල ආයෝජන කටයුතු ආරම්භ කිරීම සම්බන්ධයෙන් බලපා ඇති ගැටලු හා ඒවා නිරාකරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග ඇතුළත් වාර්තාවක් මාසයක් ඇතුළත (2024.06.06 දිනට පෙර) කාරක සභාව වෙත ඉදිරිපත් කරන ලෙස සංචාරක අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි වෙත කාරක සභාව නිර්දේශ කළේය. සංචාරක අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක MT/IAI/1/4/COPA 0 05.06.2024 දිනැති ලිපිය මගින් මේ පිළිබඳ වාතාවක් ඉදිරිපත් කර ඇත. සංචාරක සංවර්ධන අධිකාරියට පවරා දී ඇති කල්පිටිය දූපත් 12 ක් අතුරින් 10 ක් ආයෝජකයින් වෙත බදු පදනම මත ලබා දී ඇති බවත්, විශාලතම දූපත් 2 වන උව්වමුනෙයි හා බත්තලංගුණ්ඩුව යන දූපත් සඳහා මෙතෙක් ආයෝජකයින් ඉදිරිපත් වී නැති බවත් වාර්තාව මගින් පෙන්වා දී ඇත.	ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් පවරා ඇති දූපත් 12 න් දූපත් 04 ක් දීර්ඝකාලීන බදු පදනම මත ආයෝජකයන් වෙත 2010 සහ 2011 වර්ෂවලදී ලබාදී ඇත. එනම් ඉප්පන්තිව්, වෙල්ලෙයි 1, වෙල්ලෙයි 11 සහ වෙල්ලෙයි 111. වර්තමාන තත්වය - ඉප්පන්තිව් දූපත - SLTDA සහ Qube Lanka Properties (Pvt) Ltd අතර ඉපානතිව් දූපතේ අක්කර 142ක සුපිරි සංචාරක රිසෝර්ට් ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීම සඳහා බදු ගිවිසුමක් ඇති කරගෙන ඇත. මෙම ව්‍යාපෘතියට ප්‍රදේශයේ ධීවර ප්‍රජාවගෙන් දැඩි විරෝධයක් එල්ල වූ අතර, 2015 මාර්තු මාසය වන විට සංවර්ධන සැලසුම් සහ සමීක්ෂණ කටයුතු සිදු කර තිබුණ ද, එම විරෝධය අඛණ්ඩව පැවතුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නියාමන සහ අනෙකුත් අනුමැතීන් ලබා ගැනීමේ දුෂ්කරතා හේතුවෙන් Qube Lanka Properties (Pvt) Ltd ආයතනය ව්‍යාපෘතියෙන් ඉවත් වී ඇත. ව්‍යාපෘතිය යටතේ කිසිදු ඉදිකිරීම් කටයුත්තක් ආරම්භ කර නොමැති අතර 2016 මැයි 26 දිනෙන් පසු බදු ගෙවීම් ද නවතා ඇත. ඒ අනුව, දූපත නැවත ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත භාර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට අදාළ කරුණු අධිකාරියේ නීති අංශය සහ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. වෙල්ලෙයි 1, වෙල්ලෙයි 11 සහ වෙල්ලෙයි 111 දූපත් - පරිසර බලපෑම් ඇගයීම් (EIA) අධ්‍යයනය මත පදනම්ව, යෝජිත ඒකක 56කින් යුත් ජල බංගලා (Water Bungalow) 2 ක් ඉදිකිරීමට අනුමැතිය ලබා දී ඇත. නමුත්, මුහුදු පතුල පිරිසිදු කිරීම සඳහා (seabed clearance) අනුමැතිය ලබා ගැනීම ඇතුළු කොන්දේසි සපුරාලීමේදී ඇති වූ ගැටලු හේතුවෙන්, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ආයෝජකයාට නොහැකි වී ඇත. එබැවින්, අනුමැති ක්‍රියාවලියේ ඇති දුෂ්කරතා සැලකිල්ලට ගනිමින්, ආයෝජකයා ව්‍යාපෘතිය ඉදිරියට නොගෙන යාමට තීරණය කර ඇත. මේ අනුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) විසින් අදාළ දූපත් භාර දෙන ලෙස ඉල්ලා ඇත. ❖ 2021 වර්ෂයේදී සින්න එරමතිව් බස්නාහිර දූපත, 2022 වර්ෂයේ සින්න එරමතිව් දූපත, 2022 වර්ෂයේදී සින්නාරව්වේලයි දූපත, එර්මතිව් දූපත, කාකෙයිතිව් දූපත සහ පෙරියාරිව්වේලයි දූපත සඳහා බදු ගිවිසුම් අත්සන් කරන ලදී. ❖ මීට අමතරව, අනෙකුත් දූපත්වල සංවර්ධන කටයුතු හා මෙතෙක් සංවර්ධනය නොකළ දූපත් සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදු කිරීම සඳහා නියෝජ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන්

		2026.05.26 දින ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කරන ලදී. ❖ එහිදී ලබාදුන් උපදෙස් හා නිර්දේශ අනුව සියලුම ආයෝජකයන් වෙන වෙනම කැඳවා, සාධාරණ හේතු නොමැතිව නිශ්චිත කාලරාමුවක් තුළ සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට අපොහොසත් වන ආයෝජකයන්ගේ බදු ගිවිසුම් අවලංගු කිරීමටත්, ගිවිසුම් ප්‍රකාරව අයකර ගත යුතු හිඟ බදු මුදල් සහ අනෙකුත් අදාළ ගාස්තු නැවත අයකර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය හා පරිපාලනමය ක්‍රියාමාර්ග ගැනීමටත් කටයුතු කරනු ලැබේ. එමෙන්ම, එවැනි දූපත් සඳහා නැවත ආයෝජන අවස්ථා කැඳවා සුදුසුකම් ලත් නව ආයෝජකයන් තෝරා පත්කර ගනිමින් සංවර්ධන කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කිරීමට ඉදිරියේදී පියවර ගනු ලැබේ. **දූපත් සංවර්ධනය කිරීමේදී ඇතිවන ගැටලු** කෙසේ වෙතත්, ඉප්පන්තීව්, උව්වමුනේයි සහ බත්තලංගුණ්ඩුව යන දූපත්වල සංචාරක සංවර්ධන කටයුතු ආරම්භ කිරීමට පෙර එම දූපත්වල දැනට පදිංචිව සිටින ජනතාව සහ එහි පිහිටි ආගමික සිද්ධස්ථාන සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතු බව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් දැනුම් දී ඇත. තවද, මෙම දූපත් සංචාරක කලාප ලෙස සංවර්ධනය කිරීමේදී අවශ්‍ය යටිතල පහසුකම් සම්බන්ධයෙන් ද සැලකිල්ලට ගත යුතු ගැටලුකාරී තත්ත්වයන් කිහිපයක් පවතින බව නිරීක්ෂණය වී ඇත. ඒවා අතර, • ප්‍රවාහන පහසුකම් ප්‍රමාණවත් නොවීම (ජැටියක් නොමැති වීම) • පානීය ජල සැපයුම • විදුලි බල සැපයුම • අප ජල කළමනාකරණය හා ප්‍රතිකාර පද්ධති (Sewerage Treatment Facilities) **බත්තලංගුණ්ඩුව සහ උව්වමුනේයි දූපත්** 2025.07.13 දින පළ කරන ලද ප්‍රසිද්ධ ප්‍රවත්පත් දැන්වීම මඟින් බත්තලංගුණ්ඩුව සහ උව්වමුනේයි දූපත් සංවර්ධනය සඳහා ආයෝජකයන්ගෙන් අයදුම්පත් කැඳවා තිබූ අතර, 2025.10.12 දිනෙන් අවසන් වූ එම කැඳවීමට අනුව ආයෝජනය කිරීමට කැමැත්ත පළ කළ සියලුම ආයෝජකයන්ගෙන් විස්තරාත්මක ව්‍යාපෘති වාර්තා (Detailed Project Reports) කැඳවා ගෙන ඇත. එම සංවර්ධන ඇගයීම කමිටුව වෙත ඇගයීම් කිරීම සඳහා ලබා දී ඇත.
07.	සම්පූර්ණ ඇස්තමේන්තුගත පිරිවැය රු.74,630,924.00 වටිනාකමකට පුරාවිද්‍යාත්මක අනන්‍යතාවය රැකෙන පරිදි නානුඔය දුම්රිය ස්ථානය දුම්රිය උරුමයක් ලෙස	උක්ත ව්‍යාපෘතිය නිම කිරීමට අපේක්ෂිත කාලසීමාව ඉක්මවා යාම හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍යවල මිල ගණන් ඉහළ යාම නිසා ව්‍යාපෘතියේ

	නවීකරණය කිරීමේ කටයුතු 2021 වර්ෂයේ ආරම්භ කර ඇති අතර, වැඩ නිම කිරීමට නියමිත දිනය ඉක්මවා ගියද, ව්‍යාපෘතියේ වැඩ මෙතෙක් අවසන් නොකිරීම සම්බන්ධයෙන් කාරක සභාව විසින් විමසා සිටින ලදී. සංචාරක අමාත්‍යාංශය මගින් මෙම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කළ නමුත්, අදාළ කොන්ත්‍රාත්කාර සමාගමට හිඟ මුදල් ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නොමැති වීම නිසා මෙහි වැඩ කටයුතු ප්‍රමාද වූ බව ප්‍ර.ග.නි./ග.නි. සඳහන් කළේය. ඒ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ හා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයේ සහයෝගය ඇතිව මෙම ව්‍යාපෘතියේ ඉදිරි වැඩ කටයුතු කරගෙන යාමට අමාත්‍ය මණ්ඩලය උපදෙස් ලබා දී ඇති බවත්, ඒ අනුව මෙම වසරේ ඔක්තෝබර් මාසය වන විට ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට හැකි වනු ඇති බවත් ප්‍ර.ග.නි. / ග.නි. වැඩිදුරටත් සඳහන් කළේය.	නව ඇස්තමේන්තුව රු.මිලියන 101,811,673.33 (18% වැට් අතුළුව) වන අතර නව ඇස්තමේන්තුව සඳහා 2024.07.15 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. මේ වන විට ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු සිදුකරමින් පවතින අතර ගෙවීම් කටයුතු කිරීමේදී ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ නිර්දේශ සහිතව ඉදිරිපත් කළ යුතු අතර එම කටයුතු දිගින් දිගටම ප්‍රමාද වීම හා ඉදිකිරීම් ප්‍රමාද වීම මත ව්‍යාපෘතියේ කටයුතු මේ වන තුරු අවසන් වී නොමැත. මේ අතර ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහනෙහි "සිහින දුම්රිය ස්ථාන 200 ක් නවීකරණය" කිරීම යටතේ උක්ත ව්‍යාපෘතියේ මේ වන විට ආරම්භ කරන ලද ඉදිකිරීම් කොටස් අවසන් කර, ව්‍යාපෘතිය "ක්ලීන් ශ්‍රී ලංකා"වැඩසටහන යටතේ පෞද්ගලික අංශයේ දායකත්වයෙන් නවීකරණය කිරීම සඳහා යෝජනා වී ඇත. ඒ අනුව සියලුම පාර්ශවකරුවන්ගේ එකඟතාවය ලබා ගෙන උක්ත වැඩසටහන යටතේ සංවර්ධනය කිරීම සඳහා ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම හා ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

විජිත හේරත් (පා.ම)
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය

එච්.එම්. විජිත හේරත්
විදේශ කටයුතු, විදේශ රැකියා හා සංචාරක
විදේශ කටයුතු, විදේශ රැකියා
සංචාරක අමාත්‍යාංශය,
ජනරජ ගොඩනැගිල්ල
කොළඹ 01